යම් ජන කොටසක ආකල්ප සහ චින්තනය හැඩගැස්වීම කෙරෙහි ඔවුන් භාවිතා කරනා භාෂාවෙන්ද බලපෑමක් සිදුවන බව අපි නැවත නැවතත් පෙන්වා දෙමු. වෙනත් ලෙසකින් පවසන්නේ නම්, ශිෂ්ට සම්පන්න භාෂාවක් භාවිතා කිරීම ඔස්සේ වඩාත් ශිෂ්ට සම්පන්න චින්තනයක් දියුණු කිරීමටද හැකියාව ලැබෙනු ඇත.එහිදී අප කාලයක් පුරාවට භාවිතා කරනා යම් යම් යෙදුම් හා බැඳි ගර්හාත්මක, කොන් කිරීමේ ආකල්ප තිබේ නම්, එම යෙදුම් පවා වර්තමාන භාවිතාවට යෝග්‍යදැයි අප විමසිය යුතුයි.

ඊට උදාහරණ ලෙස "කෙලෙසීම" වැනි යෙදුම් ගත හැක. දූෂණය හෝ කෙළෙසීම වැනි යෙදුම් තුළ ගම්‍ය වන්නේ ඊට අදාළ වින්දිතයා අපවිත්‍ර වී ඇති බවක්, කිලිටි වී ඇති බවක් වේ. එසේම ඒ හා බැඳි ගර්හාත්මක සමාජ ආකල්පය ඔස්සේද වින්දිතයාව කොන් කිරීමකට ලක් නොවන්නේදැයි අප විමසිය යුතු වේ. එම නිසා කෙළෙසීම වැනි යෙදුම් වෙනුවට ලිංගික අපරාධය හෝ බාලවයස්කරුවෙකු සම්බන්ධයෙන් නම් ළමා ලිංගික අපයෝජනය වැනි යෙදුම් භාවිතය වඩාත් යෝග්‍ය වනු ඇත.

පහත දැක්වෙන මව්බිම පුවතේ (12/08) දක්නට ලැබෙන්නේ, සිරස්තලය තුළ එම ගැටළුකාරී කෙලෙසීම යන යෙදුම භාවිතා වී තිබුණද, පුවත් අන්තර්ගතය තුළ අපයෝජනය යනුවෙන් සඳහන් වන බවයි.

මෙහිදී පුවත් වාර්තාවකට සිරස්තල යෙදෙන්නේ අදාළ පුවත් වාර්තාව ලියූ මාධ්‍යවේදියා විසින් නොවීමේ හැකියාවක් තිබෙනා බවද අමතර කරුණක් ලෙසින් සිහිපත් කරමු.

**#MediaEthicsSL #lka #SinhalaPress#Mawbima**